# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2153/12 - 2019 දෙසැම්බර් මස 10 වැනි අඟහරුවාදා - 2019.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46 (1) (අ) ව්‍යවස්ථාවට අනුකූලව, මා විසින් අමාත්‍ය මණ්ඩලයෙහි අමාත්‍යවරුන් හා අමාත්‍යාංශ සංඛ්‍යාව ද, එකී අමාත්‍යවරයන්ට විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන පැවරීම ද නිශ්චය කරනු ලැබ ඇති හෙයින් ;

විවිධ අමාත්‍යවරයන් භාරයේ පැවතිය යුතු විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2019 දෙසැම්බර් මස 10 වන දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**(1) ආරක්ෂක අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ආරක්ෂක සේවාවන්හි කාර්යයන් පහසුකරලීම තුළින් රටේ ආරක්ෂාව සැලසීම
3. අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම
4. රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන් පවත්වාගෙන යාම
5. ආගන්තුක හමුදාවන් හා සබඳතා පවත්වාගෙන යාම හා ජාත්‍යන්තර මානුෂීය මෙහෙයුම් සඳහා සහයෝගය ලබාදීම
6. වෘද්ධ රණවිරුවන් හා ආබාධිත සොල්දාදුවන් ගේ සුබසාධන කටයුතු
7. ආරක්ෂක සේවයේ පුද්ගලයන් සඳහා ආරක්ෂක අධ්‍යාපනය, පශ්චාත් සේවා අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය ලබාදීම මගින් සේවා නිපුණතා හා කුසලතා සංවර්ධනය කිරීම
8. පුපුරණ ද්‍රව්‍ය හා ගිනිඅවි කළමනාකරණ හා නියාමන කටයුතු
9. ප්‍රදීපාගාර නඩත්තුවට අදාළ කටයුතු (වරාය අධිකාරිය සතු ප්‍රදීපාගාර හැර)
10. පුද්ගලික ආරක්ෂක සේවා සම්බන්ධ නියාමන කටයුතු

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
2. ශ්‍රී ලංකා යුද හමුදාව
3. ශ්‍රී ලංකා නාවික හමුදාව
4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව
5. ශ්‍රී ලංකා පොලීසිය
6. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
7. රාජ්‍ය රහස් තොරතුරු සේවය
8. රණවිරු සේවා අධිකාරිය
9. සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
10. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
11. ආරක්ෂක සේවා පාසල
12. ජාතික ශිෂ්‍යභට බලකාය
13. ජාතික ආරක්ෂක අරමුදල
14. ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
15. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයනය ආයතනය
16. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව
17. ලංකා ලොජිස්ටික්ස් ලිමිටඩ්
18. රක්නා ආරක්ෂණ ලංකා ලිමිටඩ්
19. ජාතික අන්තරායකාර ඖෂධ පාලක මණ්ඩලය
20. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත (2009 අංක 35)
- යුධ හමුදා පනත (1949 අංක 17)
- නාවික හමුදා පනත (1950 අංක 34)
- ගුවන් හමුදා පනත (1949 අංක 41)
- පොලිස් ආඥා පනත (1865 අංක 16)
- අපි වෙනුවෙන් අපි අරමුදල පනත (2008 අංක 6)
- ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනත (2008 අංක 5)
- වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු පනත (2009 අංක 41)
- පුපුරණ ද්‍රව්‍ය පනත (1956 අංක 21)
- ගිනි අවි ආඥා පනත (1916 අංක 33)
- වෙඩිපිටි සහ යුධ හමුදා පුහුණුවීමේ පනත(1951 අංක 24)
- උපයෝගිතා හා පරිපූරක පනත (1985 අංක 40)
- පීඩාකාරී අවි පනත (1966 අංක 18)
- මුහුදු කොල්ලකෑම් පනත (2001 අංක 9 )
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (1979 අංක 48)
- පෞද්ගලික ආරක්ෂක නියෝජිතායතන පනත (1998 අංක 45)
- මහජන ආරක්ෂක ආඥා පනත (1947 අංක 25)

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(1) ආරක්ෂක අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

11. ගලවාගැනීමේ මෙහෙයුම් සහ වෙරළ ආරක්ෂක සේවය පරිපාලනය කිරීම

12. උද්ර්පණ නීති රීති වලට අනුව අදාළ කටයුතු

13. නීතිය හා සාමය පවත්වාගෙන යාම

14. සමාජ විනය තහවුරු කෙරෙන පුළුල් ප්‍රතිසංස්කරණ ඇතුළත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

15. ජාතික පොලිස් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව පොලිස් සේවාවේ මානව සම්පත් කළමනාකරණය හා සේවා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම

16. අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට හා මැඩපැවැත්වීමට කටයුතු කිරීම

17. රථවාහන ගමනාගමනය පාලනය කිරීම

18. වර්ධනය වන තරඟකාරී වෙළඳපොළ තුළ, පොදු යහපත සුරකිමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ කටයුතු නියාමනය කිරීම

19. නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

20. අන්තර් රාජ්‍ය ආයතන සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම තුළින් රජයේ සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හිත් අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්හිත් සේවා සැපයීමේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණ මූලාරම්භන සඳහා පහසුකම් සැපයීම හා අධීක්ෂණය.

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

21. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

22. ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය

23. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ලේකම් කාර්යාලය

24. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

25. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ඊට අනුබද්ධිත ආයතන

26. ශ්‍රී ලංකා පරිඝනක හදිසි ප්‍රතිචාර සංසදය

27. ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව

28. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

29. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

30. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

31. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- රණවිරු සේවා අධිකාරිය පනත (1999 අංක 54)
- ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත (1981 අංක 68 )
- ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීමේ පනත (1999 අංක 11)
- සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමේ පනත (2000 අංක 42)
- උද්ර්පණ නීතිය (1977 අංක 8)
- මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)
- ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)
- ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)
- ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත (2011 අංක 44)
- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)

උපලේඛනය (සම්බන්ධිතයි)

(1) ආරක්ෂක අමාත්‍ය

| I වැනි තීරුව<br>කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව<br>දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් |
|---|---|---|
| 21. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.<br><br>22. සමාජයේ සියළුම ස්ථරවල තොරතුරු තාක්ෂණය භාවිතය ධෛර්යමත් කිරීම හා ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය සහ පුද්ගලික අංශය සමඟ හවුල්වී තොරතුරු තාක්ෂණ මූලාරම්භයන් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.<br><br>23. සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැළැක්වීම පිණිI වූ ජාතික මධ්‍යස්ථානය පිළිබඳ කටයුතු හා එමගින් අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට ඩිජිටල් වෝහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහාය ලබාදීම<br><br>24. අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය<br><br>25. ආගමන හා විගමන කටයුතු<br><br>26. ශ්‍රී ලාංකික පුරවැසිභාවයට අදාළ කටයුතු<br><br>27. පුද්ගලයින් ලියාපදිංචි කිරීම<br><br>28. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය නොවන සංවිධාන වල කාර්යයන් සම්බන්ධීකරණය කරමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වීමට අවස්ථා සැලසීම<br><br>29. ස්වාභාවික ව්‍යසන වලට ඔරොත්තු දෙන පරිදි (ප්‍රත්‍යස්ථ) ඉදිකිරීම් ප්‍රවර්ධනය සහ තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම<br><br>30. නායයෑම් ආපදා කළමනාකරණය සහ ඊට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම | | • පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)<br><br>• ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත (1980 අංක 31)<br><br>• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)<br><br>• ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)<br><br>• ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)<br><br>• ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13)<br><br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(1) ආරක්ෂක අමාත්‍ය**

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 31. නිවාස හා ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම | | |
| 32. කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම | | |
| 33. ස්වභාවික ව්‍යසන පෙරයීම් කිරීම හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම | | |
| 34. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම | | |
| 35. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවල දී ගලවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම | | |
| 36. ජාත්‍යන්තර මානුෂීය සහන සේවා වැඩසටහන් සම්බන්ධීකරණය | | |
| 37. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(2) මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. ජාතික ප්‍රතිපත්ති සැලැස්මට අනුකූලව රාජ්‍ය මූල්‍යය, බදුකරණය සහ ආර්ථික කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව<br>2. මහා භාණ්ඩාගාරය<br>3. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>4. ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br>5. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | • විසර්ජන පනත්<br>• ඔට්ටු ඇල්ලීම් හා සූදු බදු පනත (1998 අංක 40)<br>• රේගු ආඥාපනත (1956 අංක 17)<br>• විදේශීය ණය පනත (1957 අංක 29)<br>• හර බදු පනත (2007 අංක 12)<br>• ආර්ථික සේවා ගාස්තු පනත (2006 අංක 13) |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(2) මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

2. රාජ්‍ය මූල්‍ය හා ජාතික ආදායමට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය, නීතිමය රාමුව සකස් කිරීම හා අදාල අනෙකුත් වැඩසටහන් මෙහෙයවීම
3. රාජ්‍ය මූල්‍ය හා සාර්ව මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය, මෙහෙයවීම හා සම්බන්ධීකරණය
4. ජාත්‍යන්තර සංවර්ධන සහ මූල්‍ය ආයතන, සංවිධාන හා ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපළ සමග කටයුතු සමායෝජනය කිරීම
5. වාර්ෂික අයවැය පිළියෙළ කිරීම, ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය බලාත්මක කිරීම, ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය සම්පත් කළමනාකරණය
6. ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා රජයේ ආදායම් ඵලදායී ලෙI උපයෝජනය කිරීම
7. රජයේ මුදල් රෙගුලාසි බලාත්මක කිරීම හා නියාමනය
8. ඒකාබද්ධ අරමුදල කළමනාකරණය හා දෙපාර්තමේන්තුමය හා වෙනත් රාජ්‍ය අරමුදල් අධීක්ෂණය
9. ආදායම් නියෝජිතායතනයන්හි සමස්ත අධීක්ෂණය හා කළමනාකරණය
10. රාජ්‍ය වියදම් කළමනාකරණය
11. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමග රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් සම්බන්ධීකරණය හා උපදේශන සේවා සැපයීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

6. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
7. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
8. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
9. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
10. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
11. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
12. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
13. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
14. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
15. නීති කටයුතු දෙපාර්තමේන්තුව
16. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
17. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
18. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
19. ශ්‍රී ලංකා රේගුව
20. ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව
21. සුරාබදු දෙපාර්තමේන්තුව
22. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
23. තක්සේරු දෙපාර්තමේන්තුව
24. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
25. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
26. වාණිජ දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය ආඥාපනත (1891 අංක 5)
- සුරාබදු (විශේෂ විධිවිධාන) පනත (1989 අංක 13)
- සුරාබදු ආඥාපනත (52 වැනි අධිකාරය)
- මූල්‍ය සමාගම් පනත (1988 අංක 78)
- මූල්‍ය කල් බදු පනත (2000 අංක 56)
- මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත (2006 අංක 6)
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (2003 අංක 3)
- දේශීය ආදායම් පනත (2006 අංක 10)
- රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (2000 අංක 43)
- ලෝහෝර් ආර්යා අරමුදල පනත (1951 අංක 38)
- දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (1923 අංක 8)
- ජාතිය ගොඩනැගීමේ බදු පනත (2009 අංක 9)
- ව්‍යාපාර නාම පනත (1987 අංක 7)
- සමාගම් පනත (2007 අංක 7)
- වෙළඳ සළකුණු පනත (1964 අංක 30)
- සීට්ටු ආඥාපනත (1935 අංක 61)
- පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (2006 අංක 5)

උපලේඛනය (සම්බන්ධිතයි)

(2) මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

12. රාජ්‍ය ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ අනෙකුත් පාර්ලිමේන්තු මූල්‍ය කාරක සභාවන් පිළිබඳ භාණ්ඩාගාර සබඳතා හා අදාල සටහන් පවත්වාගෙන යාම

13. රාජ්‍ය සේවක සංඛ්‍යා කළමනාකරණය

14. ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය කිරීම හා ඇගයීම

15. දෙපාර්තමේන්තුවල කළමනාකරණ විගණන ප්‍රවර්ධනය කිරීම සඳහා වන මාර්ගෝපදේශ සම්පාදනය

16. බහුපාර්ශවික සහ ද්විපාර්ශවීක ආර්ථික සම්මුතීන් සම්බන්ධ කටයුතු

17. ශ්‍රී ලංකා මහ බැංකුව සමග සම්බන්ධීකරණයෙන් මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සාර්ව ආර්ථික කළමනාකරණය

18. ආදායම් එකතු කිරීම හා වියදම් පිළිබඳ පසු විපරම් කිරීම

19. රාජ්‍ය බැංකු සහ මූල්‍ය නියෝජිතායතනවලට අදාළ කළමනාකරණ කටයුතු

20. රක්ෂණ කටයුතු පාලනය

21. වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය යන ආයතනයන්හී සම්බන්ධීකරණ කටයුතු හා සානුබලයන් සැපයීම

22. ජාතික ආර්ථික හා සමාජ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

27. ශ්‍රී ලංකා මහ බැංකුව

28. ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිසම

29. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

30. ණය තොරතුරු කාර්යංශය

31. ජාතික මෙහෙයුම් මැදිරිය

32. රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය

33. ලෝහෝර් ආර්යා අරමුදල

34. බඳු අභියාචනා කොමිෂන් සභාව

35. වර්ජන, කෝලාහල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල

36. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

37. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

38. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

39. තිරසර සංවර්ධන සභාව

40. හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම (PQ 143)

41. ජාතික ලොතරැයි මණ්ඩලය

42. සංවර්ධන ලොතරැයි මණ්ඩලය

43. සියලුම රාජ්‍ය බැංකු හා ඒවායේ පාලිත සමාගම් හා ආශ්‍රිත ආයතන

44. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

45. ජාතික රක්ෂණ භාර අරමුදල

46. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත (1995 අංක 15)
- මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2006 අංක 12)
- මුද්දර ගාස්තු පනත (1982 අංක 43)
- එකතු කළ අගයමත බදු පනත (2002 අංක 14)
- සුභසාධක ප්‍රතිලාභ පනත (2002 අංක 24)
- මුදල් පනත (1971 අංක 38)
- පරිසර සංරක්ෂණ බදු පනත (2008 අංක 26)
- බදු අභියාචනා කොමිෂන් සභාව පනත (2008 අංක 23)
- ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත (2002 අංක 35)
- ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනත (1988 අංක 53)
- තිරසර සංවර්ධන පනත (2017 අංක 19)
- සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)
- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත (1978 අංක 15)
- මූල්‍ය නීති පනත (1949 අංක 58)
- ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (1987 අංක 36)
- ක්ෂුද්‍රමූල්‍ය පනත (2016 අංක 6)
- ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත (2006 අංක 30)

උපලේඛනය (සම්බන්ධිතයි)

**(2) මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 23. ජාතික සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති පිළියෙළ කිරීම | 47. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල | • ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත (1971 අංක 30) |
| 24. ආර්ථික සංවර්ධනයේදී පෞද්ගලික අංශයේ සහභාගීත්වය පහසුකරලීම, කාර්යක්ෂමතාවය වැඩිකිරීමට අවශ්‍ය වාතාවරණය සැකසීම හා රාජ්‍ය සහ පෞද්ගලික අංශ සම්බන්ධීකරණය කිරීම | 48. රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව | • බැංකු පනත (1988 අංක 30) |
| | | • බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීම් (විශේස විධිවිධාන) පනත (1990 අංක 4) |
| 25. සමස්ත ජාතීන් ගේ තිරසර සංවර්ධනය උදෙසා දායකත්වය ලබාදීම | | • ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත (2008 අංක 41) |
| 26. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම | | • ශ්‍රී ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත (1975 අංක 13) |
| 27. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | • නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත (1997 අංක 7) |
| | | • විනිමය පාලන පනත (1953 අංක 24) |
| | | • ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (2006 අංක 28) |
| | | • සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේස විධිවිධාන) පනත (1993 අංක 19) |
| | | • සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46) |
| | | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය (සම්බන්ධිතයි)

(3) බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍ය

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. බුදුදහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය උදෙසා යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම
3. බුද්ධ ශාසනය සුරක්ෂිතකොට පෝෂණය කිරීම උදෙසා යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘතීන් අදාළ ආයතන මගින් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
4. දහම් පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම
5. පූජා භූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීම
6. උත්තරීතර අනුශාසක මණ්ඩලයේ අවශ්‍යතා ඉටුකිරීම
7. අන්තර්ජාතික වශයෙන් ථෙරවාද බුදුදහම ප්‍රචාරය කිරීම සඳහා ප්‍රතිපත්ති සැළසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
8. නේපාලයේ පිහිටි ශ්‍රී ලංකාවට වෙන්කර දී ඇති ලුම්බිණි පූජා භූමිය සංරක්ෂණය කිරීම හා සංවර්ධනය කිරීම
9. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
2. බුද්ධ ශාසන අරමුදල
3. බෞද්ධ පුනරුද අරමුදල
4. ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන
5. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
6. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
7. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
9. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
10. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
11. ටවර්හෝල් රඟහල පදනම
12. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය
13. ජාතික කලා මණ්ඩලය
14. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය
15. අපේ ගම
16. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
17. මධ්‍යම සංස්කෘතික අරමුදල
18. ජාතික චිත්‍රපටි සංස්ථාව
19. ගාලු උරුමය පදනම
20. ශ්‍රී ලංකා පදනම
21. එස්. ඩබ්ලිව්.ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- බුද්ධ ශාසන අරමුදල පනත (1990 අංක 35)
- විහාර දේවාලගම් ආඥාපනත (1931 අංක 19)
- හින්දු සංස්කෘතික අරමුදල පනත (1985 අංක 31)
- මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත (1956 අංක 51)
- සංස්කෘතික දේපළ පනත (1988 අංක 73)
- ටවර් හෝල් රඟහල පදනම පනත (1978 අංක 1)
- ලංකා කලා මණ්ඩල පනත (1952 අංක 18)
- සීගිරි උරුමය පදනම පනත (1998 අංක 62)
- පුරාවස්තු ආඥාපනත (1940 අංක 9)
- ජාතික ලේඛනාරක්ෂක පනත (1973 අංක 48)
- මධ්‍යම සංස්කෘතික අරමුදල පනත (1980 අංක 57)
- රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47)
- ගාලු උරුමය පදනම පනත (1994 අංක 7)
- ශ්‍රී ලංකා පදනම් පනත (1973 අංක 31)
- එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනත (1981 අංක 48)

උපලේඛනය (සම්බන්ධිතයි)

(3) බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍ය

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 10. ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම | 22. ජාතික ප්‍රසංගික කලා මධ්‍යස්ථානය (නෙලුම් පොකුණ) | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 11. මුස්ලිම් ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම | 23. ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය | |
| 12. ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 13. විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම | | |
| 14. සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා වන අයුරින් සංස්කෘතික හා ජාතික උරුමයන් වල අභිමානය ප්‍රමුඛ වන සංචාරක වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම | | |
| 15. සිංහල විශ්ව කෝෂය, සිංහල ශබ්ද කෝෂය හා මහා වංශය සම්පාදනය සඳහා අඛණ්ඩව අවශ්‍ය පියවර ගැනීම | | |
| 16. ජාතීන් අතර සහයෝගය ඇතිකිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදාගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 17. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 18. නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(3) බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 19. නාට්‍ය, සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම | | |
| 20. රාජ්‍ය ලේඛණ විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම | | |
| 21. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(4) නාගරික සංවර්ධන, ජල සම්පාදන නිවාස පහසුකම් අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් පිළිබඳ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. නාගරික සංවර්ධන අධිකාරිය | • නාගරික සංවර්ධන අධිකාරිය පනත (1978 අංක 41) |
| 2. මහනගර, උපනගර හා තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය | 2. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | • නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් (විශේෂ විධිවිධාන) පනත (1980 අංක 2) |
| 3. නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු | 3. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | • ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ පනත (1961 අංක 15) |
| 4. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | 4. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | • කොළඹ දිස්ත්‍රික් (පහත් බිම්) ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත (1968 අංක 15) |
| | 5. ජාතික ප්‍රජා සැපයුම් දෙපාර්තමේන්තුව | • නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත (1946 අංක 13) |
| | 6. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | • ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත (1974 අංක 2) |
| | 7. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | • ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත (1979 අංක 17) |
| | 8. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය) | |
| | 9. නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය හා එහි පාලිත සමාගම් හා අනුබද්ධ සමාගම් | |

**උපලේඛනය** (*සම්බන්ධිතයි*)

**(4) නාගරික සංවර්ධන, ජල සම්පාදන නිවාස පහසුකම් අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

5. පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු

6. නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම

7. ජාතික භෞතික සැළසුම් හා ප්‍රාදේශීය භෞතික සැළසුම් පිළියෙල කිරීම

8. ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කර ගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදුකිරීම

9. සැම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම

10. ජලසම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් විමර්ශනය කිරීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදිකිරීම, මෙහෙයවීම හා නඩත්තු කිරීම

11. ප්‍රජා ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යක්ෂමව සහ විධිමත්ව ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

12. රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම

13. අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම්ද ඇතුලුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

10. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

11. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

12. රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

13. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

14. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

15. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

16. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

17. ඕෂන් විව් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනත (2008 අංක 36)
- බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11)
- බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (1999 අංක 4)
- පොදු පහසුකම් මණ්ඩල පනත (1973 අංක 10)
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත (2014 අංක 33)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(4) නාගරික සංවර්ධන, ජල සම්පාදන නිවාස පහසුකම් අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 14. පරිසර හිතකාමී ලෙස පිරිවැය ඵලදායී නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මඟපෙන්වීම | | |
| 15. ප්‍රධාන වශයෙන් රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම | | |
| 16. අදාළ නීති රීති හා ප්‍රමිතීන්වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය | | |
| 17. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම සහ බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව | | |
| 18. උචිත තාක්ෂණය උපයෝගි කර ගනිමින් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශ වල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | |
| 19. සහාධිපත්‍ය දේපල කළමනාකරණය සහ නියාමන කටයුතු | | |
| 20. මහජන සහාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම | | |
| 21. ඉංජිනේරු උපදේශන සේවා හා ඉදිකිරීම් කටයුතු | | |
| 22. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(5) අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වෙනත් කිසිවෙකු වෙත පවරාදෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු
3. සමාජ අවශ්‍යතාවන් සහ ගෝලීය ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන නීති පද්ධතියට අවශ්‍ය කරනු ලබන ප්‍රතිසංස්කරණ සිදුකිරීම
4. උසාවි පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් වැළැක්වීම ඇතුලුව සමස්ත පරිපාලනයට අදාළ සියලු කටයුතු ක්‍රමවත්ව හා කාර්යක්ෂමව ඉටුකිරීම
5. රජය වෙනුවෙන් අපරාධ නඩු පැවරුම් හා සිවිල් නීති කටයුතු
6. රජයට සහ සියලුම රජයේ දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබාදීම
7. නීති කෙටුම්පත් කිරීම
8. යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාව දීම, අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම
9. සමස්ත ක්වාසි පද්ධතියේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිI සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. නීතිපති දෙපාර්තමේන්තුව
2. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව
3. ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව
4. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
5. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය
6. ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව
7. උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
8. ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම
9. සමථ මණ්ඩල කොමිෂන් සභාව
10. නීති අධ්‍යාපන සභාව
11. මහා භාරකාර දෙපාර්තමේන්තුව
12. ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය
13. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් ආර්බිට්‍රේෂන් සෙන්ටර් (ගරන්ටි) ලිමිටඩ්
14. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
15. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
16. තරුණ විශෝධන පුහුණු පාසැල
17. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය
18. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය
19. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
20. හානිපූර්ණ කාර්යාලය

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩලය පනත (1987 අංක 50)
- ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත (2001 අංක 10)
- නීති අධ්‍යාපන මණ්ඩල සභා පනත (1974 අංක 6)
- ණය සහන සභා ආඥාපනත (1941 අංක 39)
- විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත (1956 අංක 15)
- ආණ්ඩුවේ රස පරීක්ෂක (භාණ්ඩ බැහැර කිරීමේ) පනත (1988 අංක 69)
- පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත (1990 අංක 19)
- සමායතන නීතිඥ ආයතන නීතිය (1978 අංක 33)
- අධිකරණ සංවිධාන පනත (1978 අංක 2)
- උසාවි භාෂා පනත (1961 අංක 3)
- නීති කොමිෂන් සභා පනත (1969 අංක 3)
- නීති ආධාර පනත (1978 අංක 11)
- සමථ මණ්ඩල පනත (1988 අංක 72)
- වංචා වැළැක්වීමේ ආඥාපනත (1840 අංක 7)
- සමාජ අබලතා වැළැක්වීමේ පනත (1957 අංක 21)
- ප්‍රාථමික අධිකරණ සංවිධාන පනත (1979 අංක 44)

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(5) අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

10. කම්කරු විනිශ්චය සභා පරිපාලනය සහ ඊට අදාළ අනෙකුත් කටයුතු
11. නීතිය නැවත ලේඛනගත කිරීම හා සංග්‍රහගත කිරීම
12. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතට (2015 අංක 4) අදාළ සියළුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම
13. බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැළසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
14. බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය
15. ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු
16. අර්බුද හේතුවෙන් ශාරීරික හා මානසික ආබාධවලට ලක් වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
17. ත්‍රස්තවාදී ක්‍රියාවන්හි යෙදී සිටි තැනැත්තන් නැවත සමාජගත කිරීම සඳහා වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම
18. ගැටුම්වලින් හානියට පත් දේපළ හා තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම
19. රට තුළ ජාතික ඒකාබද්ධතාව හා ප්‍රතිසන්ධානයත් කල් පවත්නා සාමයත් ප්‍රවර්ධනය කරලීම හා ඒ සඳහා ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- රාජ්‍ය (සිවිල් වරදෙහිලා වගකීම්) පනත (1969 අංක 22)
- අපරාධ වැළැක්වීමේ ආඥාපනත (1926 අංක 2)
- ක්වාසි අධිකරණ (පත්වීම් වලංගු කිරීමේ) පනත
- මහා භාරකාර ආඥාපනත (1922 අංක 01)
- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (2015 අංක 4)
- ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත (2000 අංක 44)
- බන්ධනාගාර ආඥා පනත (1877 අංක 16)
- තරුණ වරදකරුවන් (පුහුණු පාසැල්) පනත (1939 අංක 28)
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත (2016 අංක 14)
- හානිපූර්ණය සඳහා වන කාර්යාල පනත (2018 අංක 34)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිත පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(5) අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 20. ජාතික ඒකාබද්ධතාව තහවුරු කිරීමට බලපාන බාධක හඳුනා ගැනීම හා ඒ සඳහා කටයුතු කෙරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමග සහයෝගීත්වයෙන් ක්‍රියා කරමින් අන්තර් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය | | |
| 21. ක්ෂේත්‍ර මට්ටමේ දී ක්‍රියාකරනු ලබන අදාළ වැඩසටහන් හා ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම | | |
| 22. ජාතීන් අතර සහයෝගීතාව සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය සංවාද වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම | | |
| 23. ප්‍රධාන ජාතික භාෂාවන් හා සන්ධාන භාෂාව උපයෝගී කරගනිමින් ජාතීන් අතර සංස්කෘතික සමාජමය හා ආගමික පසුබිම අන්‍යොන්‍ය වශයෙන් අවබෝධ කරගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම | | |
| 24. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(6) ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය<br>2. වතු අංශයේ ස්වයං රැකියා චක්‍රීය අරමුදල<br>3. වැවිලි මානව සංවර්ධන භාරය<br>4. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම | • වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය පනත (2018 අංක 32)<br>• සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම පනත (2005 අංක 19) |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(6) ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 2. රජයේ සහ පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් නව ගම්මාන සහ නගර නිර්මාණය කිරීම | 5. නැවත පදිංචි කිරීමේ අධිකාරිය | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 3. වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් සවිබලගැන්වීම සඳහා මූලික පහසුකම්, ජීවනෝපාය උත්පාදන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුලු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම | 6. ග්‍රාම ශක්ති කාර්යංශය | |
| 4. ග්‍රාමීය වතු අංශයන්හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | |
| 5. අවතැන්වූවන් සඳහා අත්‍යවශ්‍ය සේවාවන් සැපයීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම | | |
| 6. අර්බුද හේතුවෙන් අවතැන් වූ සාමාන්‍ය ජනතාව නැවත පදිංචි කිරීම සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම | | |
| 7. අර්බුද හේතුවෙන් ශාරීරික හා මානසික ආබාධවලට ලක්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීමට වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | |
| 8. යළි පදිංචි කරවීමේ කටයුතුවල දී රජය සහ ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනයන්, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජය අතර කටයුතු සම්බන්ධීකරණය කිරීම | | |
| 9. ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 10. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(7) විදේශ සබඳතා අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. විදේශ සබඳතා විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. විදේශගත රාජ්‍ය දූත මණ්ඩල | • කොන්සල් කර්තව්‍ය පිළිබඳ පනත (1981 අංක 4) |
| 2. විදේශයන්හි ශ්‍රී ලංකාවේ කීර්තිමත් ප්‍රතිරූපය ස්ථාපිත කරමින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ ක්‍රියාකාරී රටක් ලෙස සහයෝගීතාව පුළුල් කරමින් විදේශ රටවල් සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාම | 2. ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය | • රාජ්‍ය දූත වරප්‍රසාද පනත (1996 අංක 9) |
| 3. ශ්‍රී ලංකාවේ කීර්තිමත් ප්‍රතිරූපයට එල්ලවන අහිතකර ප්‍රචාරයන් සම්බන්ධයෙන් නිසි ප්‍රතිචාර දැක්වීම හා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ස්ථාවර කර ගැනීම | 3. ජාතික සමුද්‍ර කටයුතු කාරක සභා ලේකම් කාර්යාලය | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලුහදථ ව්‍යවස්ථාවන් |
| 4. විදේශ රටවල් සමග රාජ්‍ය දූත සබඳතා පවත්වාගෙනයාම හා ප්‍රඥප්ති, ගිවිසුම් සහ සම්මුතීන් පිළිබඳ සාකච්ඡා කිරීම | | |
| 5. රාජ්‍ය දූත විශේස මුක්ති හා වරප්‍රසාද ලබාදීම | | |
| 6. විදේශීය වෙළඳ, ආයෝජන හා සංචාරක, රැකියා හා විදේශ මුල්‍ය සබඳතා කටයුතු ප්‍රවර්ධනය සඳහා අදාළ අමාත්‍යාංශ හා ආයතන වලට අවශ්‍ය සහාය ලබා දීම | | |
| 7. ශ්‍රී ලංකා විදේශ සේවාව සහ විදේශීය දූත මණ්ඩලවලට අනුයුක්ත කරනු ලබන නිලධාරීන්ගේ පරිපාලනය සහ වෘත්තිමය කුසලතා නැංවීමට අවශ්‍ය පියවර ගැනීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(7) විදේශ සබඳතා අමාත්‍ය**

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 8. භූ දේශපාලන ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ශ්‍රී ලංකාවට හිතකර අයුරින්, එම ප්‍රවණතා කළමනාකරණය සඳහා අවශ්‍ය උපායමාර්ග පිළිබඳ රජයට උපදෙස් දීම | | |
| 9. විදේශ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයින්ගේ සුබසාධනය පිළිබඳ අවශ්‍ය පියවර ගැනීම | | |
| 10. කොන්සියුලර් සේවාවන් සැපයීම | | |
| 11. ජාත්‍යන්තර සහයෝගීතාවය පුළුල් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව අවශ්‍ය කටයුතු ඉටු කිරීම, සම්බන්ධීකරණය හා රජයට අවශ්‍ය උපදෙස් ලබා දීම | | |
| 12. අන්තර් ජාතික හා කලාපීය දේශපාලන, ආර්ථික, පාරිසරික, සමාජ හා සංස්කෘතික සහයෝගිතා සංවිධාන සමග සක්‍රීයව කටයුතු කිරීම | | |
| 13. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා සමුද්‍රික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය වන විදේශ සබඳතා තහවුරු කිරීම | | |
| 14. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

(8) **නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම
3. වෘත්තිය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
4. රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම
5. ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම
6. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්,සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
7. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමග අන්තර් සහයෝගිතාව පවත්වා ගැනීම
8. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය හා නියාමනය කිරීමේ කටයුතු

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
3. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය
4. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
5. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
6. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
7. ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය
8. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
9. කම්කරු දෙපාර්තමේන්තුව
10. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
11. සේවක අර්ථසාධක අරමුදල
12. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය
13. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය
14. ශ්‍රම වාසනා අරමුදල
15. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
16. සීමාසහිත ශ්‍රී ලංකා රැකියා පියස
17. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
18. ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය
19. ජාතික එලදායිතා ලේකම් කාර්යාලය

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත (1990 අංක 20)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත (1995 අංක 12)
- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනත (1984 අංක 18)
- සේවක මණ්ඩල පනත (1979 අංක 32)
- සේවක අර්ථසාධක අරමුදල පනත (1958 අංක 15)
- ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත (1956 අංක 47)
- කර්මාන්ත ශාලා ආඥාපනත (1942 අංක 45)
- කාර්මික ආරවුල් පනත (1950 අංක 43)
- ප්‍රසූතිකාධාර ආඥාපනත (1939 අංක 32)
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත (2009 අංක 38)
- පාරිතෝෂික ගෙවීම් පනත (1983 අංක 12)
- සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත (1954 අංක 19)
- ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12)
- කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීම (විශේෂ විධිවිධාන) පනත (1971 අංක 45)
- වෘත්තීය සමිති ආඥාපනත (1935 අංක 14)

උපලේඛනය (සම්බන්ධිතයි)

**(8) නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 9. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම | | • පඩිපාලක සභා ආඥාපනත (1941 අංක 27) |
| 10. කම්කරු සබඳතාවලට අදාළ නීතිරීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු | | • කම්කරු වන්දි ආඥාපනත (1934 අංක 19) |
| 11. වෘත්තීය සහ රැකියා නිපුණතා නංවාලීම සඳහා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අදාළ ආයතන සමග සහයෝගීතාවය පුළුල් කිරීම | | • ගාස්තු අය කිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත (1956 අංක 37) |
| 12. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම | | • ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත (1985 අංක 21) |
| 13. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම | | • විදේශ රැකියා නියෝජිතායතන පනත (1980 අංක 32) |
| 14. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම | | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 15. විශ්‍රාම රැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ කටයුතු | | |
| 16. විදේශ රැකියා අවස්ථා බහුල කිරීම, ප්‍රවර්ධනය කිරීම හා එම රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතාවන් වැඩි දියුණු කිරීමට අදාළ ආයතන සමග කටයුතු කිරීම | | |
| 17. සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තියමය ගැටළුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය පවත්වා ගැනීම | | |
| 18. විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා නියාමන ක්‍රියාවලීන් හඳුන්වා දීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(8) නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය**

| I වැනි තීරුව<br>කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව<br>දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් |
|---|---|---|
| 19. රැකියා නියෝජිතායන නියාමනය හා ශ්‍රමිකයන් ගේ කුසලතා ඉහළ නංවමින් ඵලදායී වැටුප් හා දිරිගැන්වීම් හා සේවක සුභසාධනය ඉලක්ක කරගත් අධීක්ෂණ කටයුතු මෙහෙයවීම | | |
| 20. විදේශ රැකියා සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම හා විදේශ රැකියා නියෝජිතායතන විසින් රැකියා ස්ථාන සඳහා යොමු කිරීමේදී විදේශ රැකියාවල නියුක්තවන අයගේ සුභසාධනය තහවුරු වන ලෙස කටයුතු කිරීම | | |
| 21. ජාතික ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස ප්‍රතිපත්ති වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 22. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(9) ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය**

| I වැනි තීරුව<br>කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව<br>දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් |
|---|---|---|
| 1. ධීවර හා ජලජ සම්පත් විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව<br>2. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය<br>3. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව<br>4. සී/ස. සීනෝර් පදනම<br>5. ලංකා ධීවර සංස්ථාව | • ධීවර හා ජලජ සම්පත් පනත (1996 අංක 2)<br>• ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත (1990 අංක 23)<br>• ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත (1998 අංක 53)<br>• ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය පනත (1981 අංක 54) |
| 2. සමුද්‍ර, කිවුල් දිය (කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(9) ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය**

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 3. රජයට අයත් ධීවර යාත්‍රා කළමනාකරණය සහ මෙහෙයවීම | 6. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 4. අනන්‍ය ආර්ථික කලාපය තුළ ධීවර කටයුතු සංවර්ධනය සහ කළමනාකරණය කිරීම | 7. නෝර්ත් සී ලිමිටඩ් | |
| 5. ධීවර වරායවල් සහ නැංගුරම් පොලවල් පිහිටුවීම, නඩත්තුව සහ කළමනාකරණය | | |
| 6. ධීවර කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ යටිතල පහසුකම් දියුණු කිරීම හා ප්‍රමිතියෙන් යුතුව නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම | | |
| 7. ජීව සහ අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම | | |
| 8. ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම | | |
| 9. මුහුදු මත්ස්‍ය වගාව ඇතුලු ජලජීවි වගා සංවර්ධනය සහ අධීක්ෂණය | | |
| 10. මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම හා බෙදාහැරීම | | |
| 11. ධීවර අංශයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම හා එම ප්‍රතිඵල මත්ස්‍ය වගාවන් පුළුල් කිරීම හා ධීවර කර්මාන්තයේ උන්නතිය සඳහා යොදාගැනීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 12. නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් සාගර සම්පත් ආශ්‍රිත ආර්ථික සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ කටයුතු හා ව්‍යාපෘති පුළුල් කිරීමට පහසුකම් සැපයීම | | |
| 13. ධීවර කර්මාන්තය ආශ්‍රිතව ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හඳුන්වාදීම හා එම විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය | | |
| 14. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(10) කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම තුළින් කාන්තාවන්ගේ ජීවිතයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
3. රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම
4. ගැටුම් වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කණ්ඩායම් විශේෂයෙන් අරමුණු කර ගනිමින් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඇතිකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
5. කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම
6. කාන්තා මූලික ගෘහ ඒකක සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා අදාළ අමාත්‍යාංශ හා ආයතන සමග කුසලතා සංවර්ධන ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම තුළින් තාක්ෂණික පහසුකම් සැපයීමේ කටයුතු වල නායකත්වය හා සම්බන්ධීකරණය කිරීම
7. කාන්තා හා ළමා කටයුතු වලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
2. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව
3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
4. ජාතික ළමාරක්ෂක අධිකාරිය
5. ළමා ලේකම් කාර්යාලය
6. ජාතික සමාජ සංවර්ධන ආයතනය
7. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
8. ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය
9. සමාජ සේවා දෙපාර්තමේන්තුව
10. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය
11. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
12. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව
13. දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල
14. සමාජ ආරක්ෂණ මණ්ඩලය

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත (2005 අංක 34)
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත (1998 අංක 50)
- ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත (1941 අංක 24)
- ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)
- දිවි නැගුම පනත (2013 අංක 1)
- දිළිඳු සහන පනත (1985 අංක 32)
- සමාජ ආරක්ෂණ මණ්ඩල පනත (1996 අංක 17)
- නිවර්තන නිවාස ආඥාපනත (1907 අංක 5)
- දරිද්‍රතා නීති ආඥා පනත (1939 අංක 30)
- වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (2000 අංක 9)
- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (1996 අංක 28)
- අයාල ආඥාපනත (1841 අංක 4)
- දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනත (1992 අංක 9)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(10) කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 8. ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ කමිටු සමඟ සම්බන්ධීකරණය, සමායෝජනය සහ පසු විපරම් කිරීම | | |
| 9. අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම්, ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ උසස් මට්ටමට පමුණුවා, සමාන අවස්ථා සලසාදෙනු පිණිස සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 10. ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | |
| 11. ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම | | |
| 12. සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම | | |
| 13. සුවිශේෂී කුසලතා ඇති දරුවන් ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම | | |
| 14. සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම | | |
| 15. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ දුබලතාවන් හඳුනාගැනීම හා පුනරුත්ථාපනය සිදුකිරීම | | |
| 16. මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම | | |
| 17. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට ලාදුරු රෝගීන්ට, පිළිකා සහ තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබාදීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(10) කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 18. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම | | |
| 19. ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු | | |
| 20. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය ක්‍රමෝපායන් සැලසීම | | |
| 21. ආබාධ සහිත පුද්ගලයින් ජන ප්‍රවාහය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් උචිත ක්‍රමෝපායන් යොදා ගනිමින් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු වැඩසටහන් දියත් කිරීම | | |
| 22. ආබාධිතයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම | | |
| 23. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 24. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(11) සෞඛ්‍ය දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම,පසු විපරම් කිරීම හා ඇගයීම
2. සියලුම රෝහල් හා එම රෝහල්වල සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල කළමනාකරණය (පළාත් සභා යටතේ වන ඒවා හැර)
3. වෛද්‍ය සහ පරිපූරක වෛද්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය සහ කුසලතා ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පුහුණු අවස්ථා පුළුල් කිරීම සම්බන්ධ කටයුතු
4. ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ පරිපාලනය හා පිරිස් කළමනාකරණය
5. ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහනට අදාළ කටයුතු
6. ගුණාත්මක භාවය, උසස් ප්‍රමිතිය හා මිල ප්‍රතිපත්තියකට අනුකූලව පෞද්ගලික රෝහල්, පුණ්‍යාධාර වෛද්‍ය ආයතන සහ වෛද්‍ය මධ්‍යස්ථානවල, රසායනගාර සහ ඖෂධහල් වල ගුණාත්මකභාවය ප්‍රමිතිය හා මිල ගණන් නියාමනය හා අධීක්ෂණය පුළුල් කිරීම
7. වසංගත, බෝවන රෝග සහ බෝ නොවන රෝග පැතිරීම පාලනය, වැළැක්වීම සහ නිවාරණයට අවශ්‍ය පියවර ගැනීම
8. ජාත්‍යන්තර නිරෝධායන සහ සනීපාරක්ෂණයට අදාළ නීතිරීති ක්‍රියාත්මක කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
3. විජය කුමාරණතුංග අනුස්මරණ රෝහල
4. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
5. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
6. ජාතික ඖෂධ නියාමන අධිකාරිය
7. සියලුම ජාතික, ශික්ෂණ හා රජයේ රෝහල්
8. ජාතික සෞඛ්‍ය සභාව
9. වෛද්‍ය පර්යේෂණ ආයතනය
10. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
11. අෂ්රොෆ් අනුස්මරණ රෝහල
12. වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පාසල
13. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
14. ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාල සභාව
15. ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල
16. පෞද්ගලික වෛද්‍ය ආයතන සභාව
17. ජාතික වෘක්කවේදී, කාන්දු පෙරීම හා බද්ධ කිරීමේ ආයතනය
18. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
19. දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
20. ආයුර්වේද දෙපාර්තමේන්තුව
21. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
22. ආයුර්වේද වෛද්‍ය සභාව
23. ආයුර්වේද විද්‍යාල සහ රෝහල් මණ්ඩලය
24. ආයුර්වේද ශික්ෂණ හා පර්යේෂණ රෝහල්
25. හෝමියෝපති රෝහල වැලිසර
26. හෝමියෝපති වෛද්‍ය සභාව
27. 1990 සුවසැරිය පදනම
28. වකුගඩු අරමුදල

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- සෞඛ්‍ය සේවා පනත (1952 අංක 12)
- වෛද්‍ය ආඥාපනත (1927 අංක 26)
- වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත (1912 අංක 9)
- මනෝ රෝග ආඥාපනත (1870 අංක 1)
- ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත ( 2015 අංක 5)
- දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත (2006 අංක 27)
- ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල පනත (1981 අංක 13)
- සාත්තු නිවාස (නියාමනය) කිරීමේ පනත (1949 අංක 16)
- විෂ වර්ග, අබිං සහ අන්තරායක ඖෂධ වර්ග ආඥාපනත (1929 අංක 17)
- පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත (2006 අංක 21)
- ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩල පනත (1983 අංක 54)
- ශ්‍රී ලංකා හෙද සභා පනත (1988 අංක 19)
- මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත (1987 අංක 48)
- විජය කුමාරණතුංග අනුස්මරණ රෝහල් මණ්ඩල පනත (1999 අංක 38)
- ආයුර්වේද පනත (1961 අංක 31)
- හෝමියෝපති පනත (1970 අංක 7)
- 1990 සුවසැරිය පදනම පනත (2018 අංක 18)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(11) සෞඛ්‍ය දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය**

| *I වැනි තීරුව* කාර්යයන් හා කර්තව්‍යයන් | *II වැනි තීරුව* දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | *III වැනි තීරුව* ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් |
|---|---|---|
| 9. මහජන සෞඛ්‍ය සේවාවන් ඉහළ ප්‍රමිතියකින් හා ජනහිතකාමී ලෙස පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරිම | | |
| 10. බෙහෙත් වර්ග නිෂ්පාදනය, සහ බෙදාහැරීම ඉහළ ප්‍රමිතියකින් හා කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන්, පහසුකම් හා අනෙකුත් කටයුතු හා ආනයනය සඳහා අවශ්‍ය විනිවිදභාවයෙන් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් කාර්යක්ෂමව ඉටු කිරීම | | |
| 11. පාසල් සෞඛ්‍ය කටයුතු සහ දරුවන්ගේ දන්ත වෛද්‍ය සේවා ක්‍රියාත්මක කිරීම | | |
| 12. පොදු සනීපාරක්ෂාව සහ දුම්රිය සේවා සනීපාරක්ෂාව | | |
| 13. වතු අංශයේ සෞඛ්‍ය කටයුතු | | |
| 14. ජාතික රුධිර පාරවිලයන සේවා සම්බන්ධ කටයුතු | | |
| 15. උපලේඛනගත ශික්ෂණ රෝහල්හි සියලු දෙපාර්තමේන්තු හා සේවාවන් කළමනාකරණය හා සංවිධානය සහ ආශ්‍රිත උසස් වෛද්‍ය අධ්‍යාපන ආයතනයන් සමග කටයුතු සමායෝජනය | | |
| 16. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පර්යේෂණ අවස්ථා පුළුල් කිරීම සඳහා නව උපායමාර්ග හඳුන්වාදීම | | |
| 17. ත්‍රිපෝෂ හා විශේෂයෙන් කිරි දෙන මව්වරුන් සඳහා පෝෂණ ගුණයෙන් යුතු ආහාර සැපයීම බෙදාහැරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 18. මහජනතාවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(11) සෞඛ්‍ය දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 19. පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම | | |
| 20. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය | | |
| 21. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමවලට අවශ්‍ය අමු හා නිෂ්පාදිත ඖෂධ ආනයනය, විකිණීම හා බෙදාහැරීම | | |
| 22. ආයුර්වේද, සිද්ධ, යුනානි ආදි දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අදාළ රෝහල්, පර්යේෂණ හා පුහුණු ආයතන සහ ඖෂධ වෙළඳසැල් පිහිටුවීම හා කළමනාකරණය | | |
| 23. ඖෂධ පැලෑටි හා සකස්කළ ආයුර්වේද, සිද්ධ හා යුනානි ඖෂධ අපනයනය නියාමනය කිරීම | | |
| 24. ආයුර්වේද ඖෂධ නිෂ්පාදකයන් නියාමනය කිරීම | | |
| 25. ඖෂධ පැලෑටි වගාව ප්‍රවර්ධනය කිරීම හා දේශීය ඖෂධ වර්ග වැඩි දියුණු කිරීම ආශ්‍රිත ව්‍යාපෘති අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් ඉටු කිරීම | | |
| 26. ආයුර්වේද නිෂ්පාදකයන්, ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් හා ආයුර්වේද අතුරු වෛද්‍ය සේවක පිරිස් ලියාපදිංචි කිරීම | | |
| 27. ආයුර්වේද රෝහල්, ආයුර්වේද පර්යේෂණ ආයතන, පුහුණු ආයතන සහ ඔසුසල් පිහිටුවීම, මෙහෙයවීම සහ ප්‍රවර්ධනය | | |
| 28. දේශීය වෛද්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණ කටයුතු සහ දේශීය වෛද්‍ය සේවය ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති කිරීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(11) සෞඛ්‍ය දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 29. ආයුර්වේද වෘත්තිකයින් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා ලබාදීම | | |
| 30. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රම සංවර්ධනය හා නියාමනය කිරීම සහ දේශීය වෛද්‍ය සේවා සපයන වෛද්‍යවරුන් හා ඔවුන් ගේ සේවා පහසුකම් උසස් ප්‍රමිතියකට පත් කිරීම දිරිගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 31. සෞඛ්‍ය සේවයට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාධනය සඳහා ක්‍රියා කිරීම | | |
| 32. 1990 සුවසැරිය ගිලන් රථ සේවාව සම්බන්ධීකරණය | | |
| 33. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(12) තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. විදුලි සංදේශ සේවාවන්හි පහසුකම් වර්ධනය කිරීම හා එම ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා සහාය වීම | 1. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන<br>2. විදුලි සංදේශ දෙපාර්තමේන්තුව<br>3. සියලුම තොරතුරු තාක්ෂණ උද්‍යාන<br>4. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව<br>5. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය<br>6. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව<br>7. ස්වාධීන රූපවාහිනී ජාලය<br>8. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව<br>9. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>10. සීමාසහිත ලංකා පුවත් ආයතනය | • මුද්දර ආඥාපනත (1909 අංක 22)<br>• තැපැල් කාර්යාල ආඥාපනත (1908 අංක 11)<br>• ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)<br>• ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37)<br>• ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5)<br>• ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8)<br>• ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1986 අංක 6) |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(12) තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍ය**

| I වැනි තීරුව<br>කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව<br>දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් |
|---|---|---|
| 3. නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට විදුලි සංදේශ පහසුකම් සැලසීමට අවශ්‍ය පියවර ගැනීම | 11. සැලසිනේ රූපවාහිනී ආයතනය | • ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත (1973 අංක 5) |
| 4. ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනිමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ගයන් ගැනීම | 12. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි- සිනමා උද්‍යානය | • තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12) |
| 5. ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදිම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම | 13. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 6. ජනතාව තුළ දැනුම, ආකල්ප සහ රසඥතාවයන් ඇති කරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 14. තැපැල් දෙපාර්තමේන්තුව | |
| 7. නවීන තාක්ෂණය යොදා ගනිමින් ජනතාව ගේ රසඥතාවය වර්ධනය කිරිම හා උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහාත් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 15. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | |
| 8. තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය ප්‍රවර්ධනය සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම | 16. ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය | |
| 9. උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 10. රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අදාළ රාජ්‍ය ආයතන මනා සම්බන්ධීකරණයක් තුළ ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 11. ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(12) තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 12. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම | | |
| 13. ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම | | |
| 14. ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම | | |
| 15. වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු | | |
| 16. නවතම තාක්ෂණය සහ කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුලින් ව්‍යාපාර අරමුණු කර ගත් නවීන තැපැල් සේවයක් ලබාදීම සහ දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම | | |
| 17. වෙනත් දෙපාර්තමේන්තු සඳහා නියෝජිත ගෙවීම් කටයුතු සිදු කිරීම | | |
| 18. ලංකා මුද්දර කාර්යාංශය පරිපාලනය කිරීම | | |
| 19. රජයේ මුද්‍රණ හා ප්‍රකාශන කටයුතු | | |
| 20. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(13) උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිපාලනයට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය සහ සංවර්ධනය කිරීම
3. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධවීම හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම
4. උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ගයන් පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්ණායක හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම
5. ශ්‍රී ලංකාවේ සුදුසුකම් සහිත සිසුන්ට ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශ වීමට හැකිවන ලෙස ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. රැකියා වෙළඳපොළ ඉල්ලුමට ගැළපෙන උපාධිධාරීන් බිහිකිරීමට විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හා ඊට අවශ්‍ය මානව සම්පත් සැපයීමට අවශ්‍ය පියවර ගැනීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන
3. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
4. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
5. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
6. මහපොළ භාරකාර අරමුදල
7. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා අනුබද්ධ ආයතන
8. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
9. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)
10. කාර්මික තාක්ෂණ ආයතනය
11. ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්
12. ජාතික මූලික අධ්‍යයන ආයතනය
13. ජාතික විද්‍යා පදනම
14. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
15. ග්‍රහලෝකාගාරය
16. නවීන තාක්ෂණවේදය සඳහා වන ආතර් සී ක්ලාක් ආයතනය
17. අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
18. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
19. ශ්‍රී ලංකා බුද්ධිමය දේපල කාර්යාලය
20. ශ්‍රී ලංකා නිමැයුම්කරුවන්ගේ කොමිසම
21. නිමැයුම්කරුවන්ගේ අරමුදල
22. ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
23. ජාතික පර්යේෂණ සභාව
24. විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ලේකම් කාර්යාංශය
25. නීල හරිත වර්ධක කාර්යාංශය
26. දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය
27. රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය
28. විද්‍යාතා මධ්‍යස්ථාන

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- විශ්වවිද්‍යාල පනත (1978 අංක 16)
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995 අංක 29)
- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66)
- බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)
- ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74)
- විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත (1994 අංක 11)
- අනුකූලතා ඇගයීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත (2005 අංක 32)
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6)
- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම් පනත (1979 අංක 53)
- ශ්‍රී ලංකාවේ මූලික අධ්‍යයන ආයතන පනත (1981 අංක 55)
- බුද්ධිමය දේපල පනත (2003 අංක 36)
- ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත (1998 අංක 59)
- ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතන පනත (2019 අංක 22)
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත (2008 අංක 31)
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත (2014 අංක 31)
- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත (1976 අංක 23)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(13) උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 7. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මගින් ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා සඳහා අන්තර්ජාතික පිළිගැනීම ලබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 8. ශ්‍රි ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය සහ ප්‍රතීතනය කිරීම | | |
| 9. තරුණ ප්‍රජාව වෙනුවෙන් උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම | | |
| 10. බෞද්ධ හා පාලි අධ්‍යාපනය ඉහළ නැංවීම සහ භික්ෂුන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම | | |
| 11. අන්තර්ජාතික වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල සිදුවන පර්යේෂණයන්හි නව සොයා ගැනිම්වලට අනුගතවන පරිදි දේශීය පර්යේෂණ හා සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම | | |
| 12. දැනුම පාදක කරගත් ආර්ථික සංවර්ධනයක් උදෙසා විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනයන් වැඩිදියුණු කිරීම හා අදාළ පර්යේෂණ ආයතන සමග මනා සම්බන්ධීකරණයකින් කටයුතු කිරීම | | |
| 13. විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 14. පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(13) උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 15. තොරතුරු, නැනෝ, රොබෝ, යාන්ත්‍රි-ඉලෙක්ට්‍රොනික හා ජෛව තාක්ෂණය ද ඇතුලුව නව පර්යේෂණ හා සොයා ගැනිම් වලින් ලබාගන්නා ප්‍රතිඵල හා දැනුම ව්‍යාපාරික ප්‍රජාවද ඇතුලුව අදාළ පාර්ශවයන් වෙත ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 16. වෙනත් අමාත්‍යාංශ විෂය පථය යටතේ ගැනෙන පර්යේෂණ ආයතන හා නිපුණතා සංවර්ධන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ හා පාඨමාලා සඳහා තාක්ෂණික සහාය ලබාදීම | | |
| 17. නව සොයාගැනිම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම සඳහා අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධ කිරීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 18. උත්පාදක ආර්ථිකයට සහය ලබා දීම සඳහා ජාතික නවෝත්පාදන වැඩසටහන් ආරම්භ කිරීම, අරමුදල් සැපයීම, උසස් තාක්ෂණික ව්‍යවසායන් සඳහා පහසුකම් සැලසීම සහ නවෝත්පාදන ව්‍යවසායන් සම්බන්ධ ආයෝජන ප්‍රතිපත්ති සහ උපායමාර්ග වල ඵලදායිතාවය නියාමනය කිරීම හා ඇගයීම | | |
| 19. විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනයන් ප්‍රජාව වෙත හඳුන්වාදීම හා ඒ ආශ්‍රිත ව්‍යවසායකයන් බිහි කිරීම | | |
| 20. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියළුම පර්යේෂණ ආයතන සම්බන්ධීකරණය කරමින් ජාතික සංවර්ධන අරමුණු සාධනය සඳහා සක්‍රීය දායකත්වය ලබාදීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(13) උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන අමාත්‍ය**

| *I වැනි තීරුව* <br> *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* <br> *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* <br> *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 21. ජාත්‍යන්තර විද්‍යා, තාක්ෂණික හා පර්යේෂණ ආයතන සමග සම්බන්ධීකරණය කිරිම හා සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම | | |
| 22. විවිධ රටවල් සමඟ ද්වීපාර්ශවීය හා බහුපාර්ශවීය සහයෝගිතාවයන් ඇතිකර ගනිමින්, විද්‍යාව තාක්ෂණය හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් ආර්ථික ප්‍රගතිය ඇති කිරීම | | |
| 23. ඉදිකිරීම් කර්මාන්තය, සංචාරක, කෘෂිකාර්මික, කාර්මික, බැංකු හා මූල්‍ය, වාණිජ හා කළමනාකරණ තොරතුරු තාක්ෂණ නිපුණතා සංවර්ධනය ආදී ජාතික ආර්ථිකයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය, සංවර්ධනය සඳහා වූ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම | | |
| 24. බුද්ධිමය දේපල පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු | | |
| 25. ප්‍රමිතීන් පැනවීම සහ පරිපාලනය සම්බන්ධ කටයුතු | | |
| 26. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(14) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. පහත සඳහන් රාජ්‍ය සේවාවන්හි ආයතනික, පරිපාලනය හා පිරිස් කළමනාකරණය
ශ්‍රී ලංකා පරිපාලන සේවය
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
ඒකාබද්ධ සේවා පරිපාලනය කිරීම

3. ආයතන සංග්‍රහය යටතේ වන ප්‍රතිපාදනයන්ට අනුකූලව රාජ්‍ය සේවා ඉටු කිරීම හා මෙහෙයවීම

4. රාජ්‍ය සේවා පුහුණුව

5. රාජ්‍ය සේවකයන් විසින් ඉටු කරනු ලබන සේවාවන් ජනතා හිතකාමී ලෙසත්, ජාතික ඵලදායීතාවය ඉහල නැංවෙන ලෙසත් ඉටු කිරීම සඳහා ප්‍රතිපත්ති, වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

6. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූවන් ගේ සුභසාධනය හා ආරක්ෂණය සඳහා විශ්‍රාම වැටුප් සංග්‍රහය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම

7. ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඊට අදාළ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල
2. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
3. ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්
4. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
5. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල
6. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
7. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
8. රාජ්‍ය භාෂා කොමිසම
9. භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය
10. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
11. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
12. දේශීය ණය සහ සංවර්ධන අරමුදල
13. මිලෝදා ආයතනය (Academy of Financial Studies)

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- අනිවාර්ය රාජ්‍ය සේවා පනත (1961 අංක 70)
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත (1982 අංක 9)
- වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත (1983 අංක 24)
- වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනත (1898 අංක 1)
- වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1998 අංක 60)
- වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1970 අංක 18)
- රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත (1999 අංක 40)
- රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීම) පනත (1969 අංක 7)
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල ආඥාපනත (1942 අංක 18)
- තෑගි පිරිනැමීමේ තරඟ පනත (1957 අංක 37)
- බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත (1992 අංක 58)
- උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1951 අංක 17)
- උඩරට විවාහ හා දික්කසාද පනත (1952 අංක 44)
- මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (1951 අංක 13)
- නොතාරිස් ආඥාපනත (1907 අංක 1)
- ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1927 අංක 23)
- සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1907 අංක 19)
- රාජ්‍ය භාෂා පනත (1956 අංක 33)
- රාජ්‍ය භාෂා කොමිසම පනත (1991 අංක 18)
- ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත (2007 අංක 26)

උපලේඛනය (සම්බන්ධිතයි)

**(14) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |

*I වැනි තීරුව — කාර්යයන් හා කර්තව්‍යයන්*

8. රජයේ සියලුම විශ්‍රාම වැටුප් ක්‍රම සම්බන්ධ කටයුතු
9. අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම පිණිස රාජ්‍ය තන්ත්‍රය තුළ කාර්යක්ෂම සහ ඉහළ ගුණාත්මයෙන් යුත් ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂණගත කිරීම
10. පරිසර හිතකාමී ලෙස හා රජයේ වියදම්වල සාධාරණීකරණය මතු කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මතුවන පරිදි රාජ්‍ය උත්සව සංවිධානය කිරීම
11. දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ මණ්ඩලය පිහිටුවීම
12. උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු
13. පළාත් සභාවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම
14. පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම
15. පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්
16. පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබාදීම
17. පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම
18. පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම

*III වැනි තීරුව — ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත (1997 අංක 18)
- නිවාඩු පනත (1971 අංක 29)
- මහනගර සභා ආඥා පනත (1956 අංක 29) (52 අධිකාරිය)
- ප්‍රාදේශීය සභා පනත (1987 අංක 15)
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනත (1999 අංක 31)
- නගර සභා ආඥාපනත (235 අධිකාරිය)
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල පනත (1916 අංක 22)
- පළාත් සභා පනත (1987 අංක 42)
- පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත (1988 අංක 37)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(14) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 19. පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතුවලට අදාළව රජය විසින් ඉටු කළ යුතු කාර්යයන් | | |
| 20. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආයතනික සහ විනය කරුණු සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු | | |
| 21. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලවලට සම්බන්ධ ආයතනික කටයුතු | | |
| 22. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුභසාධන කටයුතු | | |
| 23. පාර්ලිමේන්තු අධීක්ෂණ ප්‍රතිසංස්කරණ වලට අදාළ කටයුතු | | |
| 24. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(15) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>2. ජල සම්පත් මණ්ඩලය<br>3. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය(මොරගහකන්ද සහ කළුගඟ, උමා ඔය ඇතුළු අනෙකුත් ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති)<br>4. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>5. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන් ගේ සභාව<br>6. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | • වාරිමාර්ග ආඥාපනත (1946 අංක 22)<br>• ජල සම්පත් මණ්ඩල පනත (1964 අංක 29)<br>• ශ්‍රී ලංකාවේ මහවැලි අධිකාරිය පනත (1979 අංක 23)<br>• ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත (2017 අංක 4)<br>• ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)<br>• පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)<br>• ගස් හෙලීම (පාලන කිරීම) පනත (1951 අංක 9) |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(15) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 2. මහවැලි අධිකාරි පනත යටතේ සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒ යටතේ පිහිටුවන ලද සංවිධාන හා සම්බන්ධිත කටයුතු<br><br>3. ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනය<br><br>4. තොග පවත්වා ගැනීම් හා සැපයුම් කටයුතු ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම නවීන තාක්ෂණය යොදාගනිමින් කෘෂිකාර්මික නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන උපායමාර්ග හා සැලසුම් සකස් කිරීම<br><br>5. බෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br><br>6. විවිධ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන් සඳහා විධිමත් පුහුණුවක් ලබාදීම, අධ්‍යාපන හා පර්යේෂණ අවස්ථා පුළුල් කිරීමට ක්‍රමවේද සැකසීම<br><br>7. කෘෂි හා සත්ත්ව නිෂ්පාදනයන්හි අගය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමෝපායන් හඳුන්වාදීම<br><br>8. කෘෂි හා සත්ත්ව නිෂ්පාදන මත පදනම් වූ ව්‍යවසායකයින් දිරිගැන්වීම හා වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමට පියවර ගැනීම<br><br>9. දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම<br><br>10. කුඹුරු ඉඩම් උපරිම ලෙස කෘෂිකර්ම බෝග වගාවන් සඳහා යොදා ගැනීමට මුල්තැන ලැබෙන පරිද්දෙන් එම ඉඩම්වලට අදාළ සියලු කටයුතු ඉටුකිරීම | 7. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>8. ජාතික පොහොර ලේකම් කාර්යාලය<br>9. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය<br>10. මාංශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය<br>11. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය<br>12. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව<br>13. පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය<br>14. වී අලෙවි මණ්ඩලය<br>15. සීමාසහිත ලංකා පොහොර සමාගම<br>16. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම<br>17. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්<br>18. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය<br>19. ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය<br>20. ග්‍රාමීය පුණර්ජීවන අරමුදල<br>21. ග්‍රාමීය ආර්ථික පුණර්ජීවන අරමුදල<br>22. ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල)<br>23. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>24. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්<br>25. මිල්කො (ප්‍රයිවට්) ලිමිටඩ්<br>26. සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිස් සමාගම | • පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)<br>• බීජ වී පනත (2003 අංක 22)<br>• පස් සංරක්ෂණ පනත (1996 අංක 24)<br>• කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)<br>• පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)<br>• ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)<br>• වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)<br>• කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1978 අංක 11)<br>• සත්ත්ව රෝග පනත (1992 අංක 59)<br>• සත්ත්ව ආහාර පනත (1986 අංක 15)<br>• සත්ත්ව පනත (1958 අංක 29)<br>• පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)<br>• ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(15) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 11. වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැටසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම | | |
| 12. ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම සහ සමාජ ආරක්ෂණ කටයුතු | | |
| 13. ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදාහැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම | | |
| 14. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට සම්බන්ධ කාර්යයන් | | |
| 15. එළවළු සංවර්ධන මණ්ඩලයේ හා පළතුරු සංවර්ධන මණ්ඩලයේ වත්කම් හා අනෙකුත් සම්පත්වලට අදාළ කටයුතු | | |
| 16. කාබනික පොහොර නිෂ්පාදනය සහ වස විසෙන් තොර ගොවිතැන ප්‍රචලිත කිරීම | | |
| 17. කෘෂිකාර්මික සංවර්ධන කලාප, කෘෂි ගම්මාන හා තිරසර ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් ප්‍රචලිත කිරීම | | |
| 18. වී, ධාන්‍ය හා අනෙකුත් කෘෂි බෝග මිල දී ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා අළෙවියට අදාළ කටයුතු කිරීම | | |
| 19. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය | | |
| 20. හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව කෘෂිකර්ම හා පශු සම්පත් ක්ෂේත්‍රයේ උපායමාර්ගික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(15) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 21. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නගාසිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 22. ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය සංවර්ධනය කිරීම | | |
| 23. වාරිමාර්ග හා ජලාපවහන පද්ධති ඉදිකිරීම, ක්‍රමවත් නඩත්තුව මගින් අවශ්‍ය ජල සැපයුම ක්‍රමාණුකූලව ලබාදීම හා ජල ගැලීම් පාලන යෝජනා ක්‍රම තුළින් ජලාපවහන හා ගංවතුර පාලනය සිදුකිරීමට කටයුතු කිරීම | | |
| 24. කෘෂිකාර්මික සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙමින් ප්‍රතිපත්තිමය ලෙසින්, විදුලිය හා පානීය ජලය සැපයීමට අවශ්‍ය ජලාශ හා වාරි පහසුකම් මනා ලෙස කළමනාකරණයක් පවත්වාගෙන යාම | | |
| 25. ජල පෝෂක ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි නිශ්චිත වශයෙන් නිර්ණය කර ඒවා තිරසාර අයුරින් සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම | | |
| 26. ගංගා, ඇල, දොළ වැව් ආදී ජලමූලාශ්‍ර ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීම | | |
| 27. ජල දූෂණය පාලනය කිරීම සහ ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම | | |
| 28. වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 29. වෙලි ආරක්ෂණ විධිවිධාන සම්පාදනය කිරීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(15) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 30. කරදිය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම | | |
| 31. භූගත ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම හා වැසි ජල සංරක්ෂණය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම | | |
| 32. භූ සම්පත්හි තිරසර භාවිතය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | |
| 33. ග්‍රාමීය ජනදිවිය සවිබල ගැන්වීමට අදාළ යටිතල මූල්‍ය පහසුකම් හා ජීවනෝපාය සංවර්ධනය තුළින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 34. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම | | |
| 35. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු | | |
| 36. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 37. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(15) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 38. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු | | |
| 39. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(16) අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. දේශීය වෙළඳපොල තුළ පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමෙන් හා හිඟයකින් තොරව සාධාරණ මිල ගණන්වලට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම<br><br>3. 1949 අංක 6 දරන උකස් පනතෙහි 114 වැනි වගන්තිය යටතේ ණය දෙන ආයතන අනුමත කිරීම<br><br>4. පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිළ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවෙහි යෙදවීම | 1. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව<br>2. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය<br>3. සීමාසහිත ලංකා සතොස<br>4. සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රෙඩිං සමාගම<br>5. සමූපකාර තොග වෙළඳ සංස්ථාව<br>6. මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව<br>7. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමූපකාර සමිති ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්)<br>8. සමූපකාර සේවක කොමිෂන් සභාව<br>9. ජාතික සමූපකාර සංවර්ධන ආයතනය<br>10. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව<br>11. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන | • පාරිභෝගික කටයුතු අධිකාරි පනත (2003 අංක 9)<br>• පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ පනත (1979 අංක 1)<br>• සමූපකාර තොග වෙළඳ සංස්ථා පනත (1949 අංක 44)<br>• සමූපකාර සේවක කොමිෂන් සභා පනත (1972 අංක 12)<br>• සමූපකාර සමිති පනත (1972 අංක 5)<br>• වෙළඳුන්ට බලපත්‍ර දීමේ පනත (1961 අංක 62)<br>• මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත (1995 අංක 35)<br>• ජාතික සමූපකාර සංවර්ධන ආයතන (සංස්ථාගත කිරීමේ) පනත (2001 අංක 1)<br>• ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත (1980 අංක 41)<br>• කිරුම් හා මිනුම් ආඥාපනත (1946 අංක 37)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

**(16) අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 5. වෙළඳපොල තරඟකාරීත්වය තහවුරු කරමින් වෙළඳපොල තුළ අවිධිමත් ලෙස භාණ්ඩ ඌණතාව අවම කරමින් හා ස්වයං නියාමනය දිරිමත් වන පරිදි ක්‍රියා මාර්ග ගැනීම | | |
| 6. ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ අවම තරඟකාරී මිළ ගණන්වලට අඛණ්ඩව සැපයෙන හා සැපයුම්කරුවන් ගේ සමපේක්ෂණ හැසිරීම් වළක්වා ගනිමින් පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම | | |
| 7. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(17) අධ්‍යාපන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. අධ්‍යාපන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවයක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම | 1. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව<br>2. ජාතික අධ්‍යාපන ආයතනය<br>3. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය<br>4. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය<br>5. අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල<br>6. ගුරු අධ්‍යාපනය පිළිබද ජාතික අධිකාරිය<br>7. අධ්‍යාපන විද්‍යාපීඨ<br>8. ගුරු විද්‍යාල<br>9. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය<br>10. විභාග දෙපාර්තමේන්තුව<br>11. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව<br>12. ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම<br>13. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | • ආධාර ලබන පාසල් සහ අභ්‍යාස විද්‍යාල පනත (1960 අංක 5)<br>• අධ්‍යාපනික විද්‍යායතන පනත (1986 අංක 30)<br>• ගුරු අධ්‍යාපනය පිළිබද ජාතික අධිකාරිය පනත (1997 අංක 32)<br>• ජාතික අධ්‍යාපන ආයතන පනත (1985 අංක 28)<br>• රජයේ විභාග පනත (1968 අංක 25)<br>• පාසල් සංවර්ධන මණ්ඩල පනත (1993 අංක 8)<br>• යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනත (1999 අංක 44)<br>• රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24)<br>• ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත (1991 අංක 19)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය (සම්බන්ධිතයි)

(17) අධ්‍යාපන අමාත්‍ය

| I වැනි තීරුව කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් |
|---|---|---|
| 3. පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්ති ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ නියාමනය | | |
| 4. ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව පාසැල් සිසුන්ට ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම | | |
| 5. ජාතික පාසැල් සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් යුත් ළමා මිතුරු පරිසර හිතකාමී සියළු මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 6. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසැල් නියාමනය කිරීම | | |
| 7. ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා පරිගණක විද්‍යාගාර ඇතුළු නූතන තාක්ෂණික පහසුකම් යොදාගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය | | |
| 8. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම | | |
| 9. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 10. රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම | | |
| 11. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

(17) අධ්‍යාපන අමාත්‍ය

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 12. සියලු පාසැල් වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පංති කාමර, ගුරුවරුන් ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියලු භෞතික පහසුකම් හා පරිසර හිතකාමී පාසැල් සංවර්ධනය ජාතික පාසැල්වල මෙන්ම පළාත් සභා වලට අයත් පාසැල්වල ද පොදු ප්‍රමිතියක් යටතේ දියුණු කිරීම | | |
| 13. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ පිරිස් කළමනාකරණ කටයුතු | | |
| 14. ජාතික ප්‍රතිපත්ති රාමුවක් තුළ පළාත් සභා පාසැල්, ජාත්‍යන්තර පාසැල්, පෞද්ගලික පාසැල් වල අධ්‍යාපන හා ශිෂ්‍ය සුභසාධන, ප්‍රවාහන, සනීපාරක්ෂක කටයුතු සම්බන්ධීකරණය | | |
| 15. ඵලදායී ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම හා ගුරුවරුන් පුහුණු කිරීමේ හා ඔවුන් ගේ කුසලතා සංවර්ධනය | | |
| 16. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 17. පාසල් සංවර්ධන මණ්ඩල පරිපාලනය | | |
| 18. අධ්‍යාපන ආයතන නීතිගත කිරීම | | |
| 19. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම | | |
| 20. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ එම ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(18) ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ක්‍රීඩා හා තරුණ කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියට හා ජාත්‍යන්තර ඔලිම්පික් ප්‍රඥප්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සානුබලයන් සැපයීම
3. ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
4. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැඟීම සඳහා ක්‍රීඩාව යොදාගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදුකිරීම
6. ජාතික ක්‍රීඩා සංගම් නියාමනය කිරීම
7. ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේදී තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම
8. ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
2. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
3. ජාතික ක්‍රීඩා සංකීර්ණ
4. ජාතික ක්‍රීඩා විද්‍යායතනය
5. ජාතික ක්‍රීඩා සභාව
6. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
7. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය
8. ජාතික තරුණ සේවා සභාව
9. ජාතික යොවුන් සේනාංකය
10. ජාතික යෞවණ තිළිණ ප්‍රදාන අධිකාරිය
11. සී/ස. ජාතික තරුණ සේවා සමූපකාරය
12. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය
13. ස්මාර්ට් ශ්‍රී ලංකා ආයතනය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ක්‍රීඩා නීතිය (1973 අංක 25)
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරී පනත (1999 අංක 17)
- ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)
- ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)
- යොවුන් සේනාංක පනත (2002 අංක 21)
- ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනත (1939 අංක 48)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(18) ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 9. තරුණ පරපුරේ අභිලාෂයන් ඉටුවන ජාතික වැඩපිළිවෙලක් අරමුණු කරගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම<br><br>10. තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br><br>11. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br><br>12. තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු<br><br>13. තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලීත්වය සමාජ පිළිගැනීමක් ඇතිවන හා ඔවුන්ට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකිවන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම<br><br>14. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(19) මාර්ග මහාමාර්ග අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති | 1. මාර්ග සංවර්ධන අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. මාර්ග නඩත්තු භාර අරමුදල | • ජාතික මංමාවත් පනත (2008 අංක 40)<br>• මාර්ග සංවර්ධන අධිකාරිය පනත (1981 අංක 73)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**19) මාර්ග මහාමාර්ග අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. ග්‍රාමීය, පූර්ව නගර හා නාගරික ප්‍රදේශ සබඳතා පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්ත්වයෙන් යුක්ත වන පරිදි ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ථ තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br><br>3. අධිවේගී මාර්ග සංවර්ධනය, ගාස්තු නියම කිරීම, රැස්කිරීම සහ නියාමනය කිරීම<br><br>4. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, එම වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මෙහෙයවීම<br><br>5. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(20) වරාය හා නාවික කටයුතු අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. වරාය හා නාවික කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. සීමාසහිත ලංකා නැව් සංස්ථාව සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>3. වෙළඳ නාවික ලේකම් කාර්යාලය | • ලංකා නැව් සංස්ථා පනත (1971 අංක 11)<br>• පහයන තටාක හා පේටන්ට් දියත් ආඥාපනත (1908 අංක 5)<br>• නැව් නියෝජිතයින්ට බලපත්‍රදීමේ පනත (1972 අංක 10)<br>• මාස්ටර්ස් ඇටෙන්ඩන්ට් ආඥාපනත (1865 අංක 6) |

**උපලේඛනය** (සම්බන්ධිතයි)

**(20) වරාය හා නාවික කටයුතු අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 2. වානිජ වරායන් සංවර්ධනය හා කළමනාකරණය කිරීම<br><br>3. අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධන සහ පරිපාලන කටයුතු<br><br>4. නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය<br><br>5. නාවික සේවාවන් සඳහා තරඟ රීති මාලාවන් පැනවීම<br><br>6. නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහාය වීම<br><br>7. බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාරගැනීම<br><br>8. නාවික කටයුතු සංවර්ධන අරමුදල පරිපාලනය කිරීම<br><br>9. නැව් ගාස්තු හා නාවික සේවා කටයුතු<br><br>10. වෙරළාසන්න මඟී ප්‍රවාහනය<br><br>11. නෞකා හිමිකාරීත්වය සහ මෙහෙයුම්, නැව් කළමනාකරණය, නැව් තැරැව්කරණය සහ නියෝජිත සේවා<br><br>12. රේගු නියෝජිතායතන සහ සමස්ථ නෞකා භාණ්ඩ ප්‍රවාහන විසඳුම්<br><br>13. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | • වෙළඳ නැව් පනත (1971 අංක 52)<br>• ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත (1979 අංක 51)<br>• බෝට්ටු ආඥා පනත (1900 අංක 4)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(21) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. ව්‍යවසායකත්වය පෙරට ගත් ජාතික ආර්ථික ප්‍රවාහයක් සම්බන්ධ ක්‍රමෝපායන් සැකසීම<br><br>3. ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම<br><br>4. රාජ්‍ය ව්‍යවසාය ක්ෂේත්‍රය තුළ නව දැනුම හා තාක්ෂණය හඳුන්වාදීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම<br><br>5. රාජ්‍ය ව්‍යවසායයන්හි නිෂ්පාදිතයන්ගේ ප්‍රමිතිය හා ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br><br>6. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු | 1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>2. ජාතික ශිල්ප සභාව<br>3. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)<br>4. ජාතික මෝස්තර මධ්‍යස්ථානය<br>5. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම<br>6. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය | • ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35)<br>• ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4)<br>• ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත (2006 අංක 17)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(22) කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය
3. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළඳාම ප්‍රවර්ධනය හා නියාමනය
4. II තීරු වෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
2. ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතනය
3. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව
4. කහටගහ ග්‍රැෆයිට්
5. ලංකා ලේලන්ඩ් ලිමිටඩ්
6. ලංකා අශෝක් ලේලන්ඩ් ලිමිටඩ්
7. සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම
8. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
9. ලංකා ටෙක්ස්ටයිල් මිල්ස් එම්පෝරියම් ලිමිටඩ්
10. ලංකා සළුසල ලිමිටඩ්
11. සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව
12. ලංකා ඛනිජ වැලි සමාගම
13. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්
14. බෝගල ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
15. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම
16. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)
17. සීමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම (KESCO)
18. සිමාසහිත බී.සී.සී.සමාගම
19. තල් සංවර්ධන මණ්ඩලය
20. මාන්තායි සෝල්ට් ලිමිටඩ්
21. අලිමංකඩ ලුණු ලේවාය
22. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
23. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ශ්‍රී ලංකා පේෂකර්මාන්ත හා ඇඟලුම් ආයතන පනත (2009 අංක 12)
- රෙදිපිළි පංගු මණ්ඩල පනත (1996 අංක 33)
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත (1993 අංක 50)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැතිව මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

**(23) ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ප්‍රවාහන සේවා කළමනාකරණ විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම,

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය
3. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
4. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
5. ජාතික ගමනාගමන කොමිෂන් සභාව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- දුම්රිය පනත (1950 අංක 18)
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත (2005 අංක 27)
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත (1997 අංක 25)
- මෝටර් රථ ප්‍රවාහන පනත (1951 අංක 14)

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(23) ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. නව තාක්ෂණය යොදා ගනිමින් ඒකාබද්ධ මගී සහ භාණ්ඩ දුම්රිය ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය හා දුම්රිය සේවා සැපයීම
3. මගී තොටුපල සේවාවන් සැපයීම
4. ආරක්ෂාකාරී සහ විශ්වාසනීය මගී ප්‍රවාහන සේවාවක් සැපයීම
5. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් හඳුන්වාදීම
6. පෞද්ගලික ප්‍රවාහන සේවාවන් නියාමනය කිරීම
7. නව දුම්රිය මාර්ග ඉදිකිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කිරීම, පුළුල් කිරීම සහ ඊට අදාළව ඉඩම් පවරා ගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුලු සියලු කටයුතු
8. මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම
9. රියදුරු බලපත්‍ර නිකුත් කිරීම
10. මෝටර් රථවාහනවලට අදාළ නීතිරීති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ නියාමනය කිරීම
11. හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයේ දායකත්වය උදෙසා උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
12. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

6. සීමාසහිත ලක්දිව ඉංජිනේරු සමාගම
7. සීමාසහිත වේරහැර ඉංජිනේරු සේවා සමාගම (WESCO)
8. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත (1991 අංක 37)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(24) විදුලිබල හා බලශක්ති අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. විදුලිබල හා බලශක්ති විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනා දී මූලාශ්‍රයන් මගින් පුනර්ජීවන බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය
3. හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම
4. ග්‍රාමීය විද්‍යුතනය
5. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම
6. බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
7. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම
8. ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු
9. ඛනිජ තෙල් හා ස්වාභාවික ගෑස් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පාලිත සමාගම්
2. ලංකා විදුලිබල සමාගම
3. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම
4. සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
5. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
6. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
7. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
8. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
9. සීමාසහිත ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්තය
10. ඛණිජ තෙල් සම්පත් සංවර්ධන කාර්යාංශය
11. සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ශ්‍රී ලංකා විදුලිබල පනත (2009 අංක 20)
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35)
- බලශක්ති සංරක්ෂණ අරමුදල පනත (1985 අංක 2)
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (2014 අංක 40)
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත (1961 අංක 28)
- ඛනිජ තෙල් සම්පත් සංවර්ධන පනත (2003 අංක 26)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(24) විදුලිබල හා බලශක්ති අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 10. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් හා අතුරු නිෂ්පාදන කටයුතු, තොග පවත්වා ගැනීම හා නිෂ්පාදනය හා බෙදාහැරීම | | |
| 11. ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | |
| 12. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**(25) පරිසර වනජීවී සම්පත් අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. පරිසර සහ වනජීවී සම්පත් විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. වර්තමාන හා අනාගත පරපුර උදෙසා පරිසරය සුරැකීම වෙනුවෙන් ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම<br><br>3. පරිසර සංරක්ෂණය හා කළමනාකරණ පිළිබඳ ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදනය කිරීම<br><br>4. කැලෑ සහ වන විද්‍යා කටයුතු<br><br>5. වනාන්තර, වනසතුන් හා තුරුලතා ආරක්ෂා කිරීම හා සංරක්ෂණය | 1. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>2. මධ්‍යම පරිසර අධිකාරිය<br>3. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>4. සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම<br>5. රාජ්‍ය දැව සංස්ථාව<br>6. ලංකා ටිම්බර් ප්ලාන්ට් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස්<br>7. සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරිය<br>8. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>9. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව<br>10. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව<br>11. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>12. වනජීවී භාරය | • කැලෑ ආඥා පනත (453 අධිකාරය)<br>• පතල් හා ඛනිජ පනත (1992 අංක 33)<br>• ජාතික පාරිසරික පනත (1980 අංක 47)<br>• ජාතික උරුම වනභූමි පනත (1988 අංක 3)<br>• සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ පනත (2008 අංක 35)<br>• වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57)<br>• ජාතික සත්වෝද්‍යාන පනත (1982 අංක 41)<br>• උද්භිද උද්‍යාන ආඥාපනත (1928 අංක 31)<br>• වන සතුන් හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (1937 අංක 2)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(25) පරිසර වනජීවී සම්පත් අමාත්‍ය**

| *I වැනි තීරුව* <br> *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* <br> *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* <br> *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 6. රටේ වන සනත්වය සුරක්ෂිත කරමින් දැව අවශ්‍යතාවය සපුරා ගැනීමේ වනෝත්පාදන හා වාණිජ වන වගා ප්‍රවර්ධනය කිරීම | | |
| 7. පරිසර දූෂණය මැඩලීම පිණිස වැඩසටහන් සම්පාදනය කිරීම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම | | |
| 8. සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු | | |
| 9. වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය | | |
| 10. පරිසර වෙනස්කම් සහ කාබන් භාවිතය අවම ආර්ථිකයක් සහිත තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා නීති සහ උපාය මාර්ග සම්පාදනය කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම | | |
| 11. සිව්පාවුන්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශි කිරීම සහ ප්‍රදර්ශනය කිරීමට අදාළ කටයුතු | | |
| 12. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල් වගා කර්මාන්තය වැඩි දියුණු කිරීම | | |
| 13. වනජීවී සම්පත් සංරක්ෂණය | | |
| 14. වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 15. වඳවී යාමේ තර්ජනයට මුහුණ පාන සත්ත්ව වර්ගයන්හි අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතිය හා ඊට අදාළ කටයුතු | | |
| 16. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(26) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ඉඩම් හා ඉඩම් සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. රජයේ ඉඩම් පරිපාලනය, කළමනාකරණය හා ඉඩම් පරිහරණ සැලසුම්කරණය
3. ඉඩම් නිරවුල් කිරීම හා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු
4. රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම
5. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පරිපාලනය හා නීත්‍යානුකූලව බෙදාදීම
6. ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් ලබාදීම
7. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
3. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
4. මිනුම්පති දෙපාර්තමේන්තුව
5. මිනින්දෝරු සහ සිතියම් ආයතනය
6. ඉඩම් මැනුම් සභාව
7. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ඉඩම් අත්කර ගැනීමේ පනත (1950 අංක 9)
- ඉඩම් සංවර්ධන ආඥාපනත (1935 අංක 19)
- ඉඩම් ආපසු පවරා ගැනීමේ ආඥාපනත (1942 අංක 61)
- ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත (1931 අංක 20)
- රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත (1979 අංක 43)
- රජයේ ඉඩම් ආඥාපනත (1947 අංක 8)
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත (1972 අංක 1)
- රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත (1979 අංක 7)
- මැනුම් පනත (2002 අංක 17)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(27) වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. වැවිලි බෝග වගා කටයුතු සඳහා ගුණාත්මක භාවයෙන් යුත් බීජ හා පැල ලබාදීම මගින් ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම
3. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉහළ නැංවීම
4. වැවිලි බෝග මත පදනම් වූ එකතුකල වටිනාකම වැඩිකිරීම සම්බන්ධ කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
5. තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම
6. තේ අපනයනය සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම
7. තේ හා රබර් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම
8. බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම
9. තේ, රබර් සහ පොල් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
2. ශ්‍රී ලංකා තේ මණ්ඩලය
3. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
4. තේ ශක්ති අරමුදල
5. තේ පර්යේෂණ ආයතනය
6. තේ හා රබර් වතු (පාලනය කිරීමේ හා කැබලි කිරීමේ) මණ්ඩලය
7. සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව
8. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
9. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
10. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
11. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
12. සීමාසහිත හලාවත වැවිලි සමාගම
13. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
14. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
15. තුරුසවිය අරමුදල
16. රබර් පර්යේෂණ ආයතනය
17. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
18. පොල් වගා කිරීමේ මණ්ඩලය
19. පොල් සංවර්ධන අධිකාරිය
20. පොල් පර්යේෂණ ආයතනය
21. කප්රුක අරමුදල
22. ශ්‍රී ලංකා කජු සංස්ථාව
23. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම
24. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
25. කන්තලේ සීනි සමාගම
26. උක් පර්යේෂණ ආයතනය
27. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
28. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනය පනත (1979 අංක 45)
- ලංකා තේ මණ්ඩලය පනත (1970 අංක 15)
- තේ පාලන පනත (1957 අංක 51)
- තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)
- කුඩා තේ වතු සංවර්ධන පනත (1975 අංක 35)
- තේ ආධාර මුදල් පනත (1958 අංක 12)
- තේ (බදු හා අපනයන පාලනය) පනත (1959 අංක 16)
- තේ පර්යේෂණ මණ්ඩල පනත (1993 අංක 52)
- තේ හා රබර් වතු (කැබලි කිරීම් පාලනය කිරීම) පනත (1958 අංක 2)
- රබර් නැවත වගාකිරීමේ සහනාධාර පනත(1953 අංක 36)
- රබර් පර්යේෂණ මණ්ඩල ආඥාපනත (1930 අංක 10)
- රබර් පාලන පනත (1956 අංක 11)
- තුරුසවිය අරමුදල් පනත (2000 අංක 23)
- පොල් වගාකිරීමේ මණ්ඩල පනත (1971 අංක 46)
- පොල් සංවර්ධන පනත (විශේෂ විධිවිධාන) (1984 අංක 45)
- පොල් සංවර්ධන පනත (1971 අංක 46)
- කොහු කෙඳි පනත (1967 අංක 7)
- පොල් නිෂ්පාදන ආඥාපනත (1935 අංක 13)
- පොල් පර්යේෂණ මණ්ඩල පනත (1950 අංක 37)
- කප්රුක අරමුදල් පනත (2005 අංක 31)
- උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)
- අපනයන කෘෂි සංවර්ධන පනත (1992 අංක 46)
- ▪ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(27) වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 10. දේශීය නිෂ්පාදන වල අගය එකතු කිරීම, ඉහල වටිනාකමකින් යුත් භාණ්ඩ නිශ්පාදනය කිරීම, අපනයන වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම හා කර්මාන්ත සුරක්ෂිතභාවය ඇති කරමින් ගොවීන්, ධීවරයින් සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරීම සඳහා ප්‍රතිපත්ති, උපායමාර්ග සම්පාදනය කිරීම හා අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් ක්‍රියාත්මක කිරීම | | |
| 11. අගය එකතු කල නිෂ්පාදනය ද ඇතුලුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම | | |
| 12. තේ, පොල්, රබර් මූලික කරගත් ඉඩම් උපරිම ලෙස පළතුරු, එළවළු, සත්ත්ව ගොවිපළ ආදී කටයුතු සඳහා භාවිත කිරීමත්, ඒවායේ අතුරු බෝග යොදවමින් ඵලදායීතාවය ඉහළ නැංවීමෙන්, එම ඉඩම් වෙනත් කටයුතු සඳහා යෙදීමේ දි සීමාවන් පැනවෙන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම | | |
| 13. ප්‍රති අපනයනය වෙනුවට තේ, කුරුඳු, ගම්මිරිස්, වැනි දේශීය බෝග වර්ග ශ්‍රී ලංකා සන්නාම නාම ලෙස අපනයන වෙළඳපළ සඳහා දියුණු කිරීම | | |
| 14. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

**උපලේඛනය** (සම්බන්ධිතයි)

**(28) කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීමට පසු විපරම් කිරීම හා ඇගයීම

2. 2011 අංක 43 දරන පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ඌන උපයෝජිත වත්කම් සම්බන්ධ කටයුතු

3. ජාත්‍යන්තර වෙළඳ සබඳතා ශක්තිමත් කිරීම හා දේශීය නිෂ්පාදනයන් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම

4. ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය සෘජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම

5. කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය

6. ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය

7. අපනයන විවිධාංගීකරණය, දිරි ගැන්වීම, අපනයන සංවර්ධනය හා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම

8. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. 2011 අංක 43 දරන පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ඌන උපයෝජිත වත්කම්
2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම පනත (2011 අංක 43)
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත (1979 අංක 40)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය *(සම්බන්ධිතයි)*

**(29) සංචාරක සහ ගුවන් සේවා අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. සංචාරක සහ ගුවන් සේවා විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීමඃ පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය<br>2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය<br>4. ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශය<br>5. සිවිල් ගුවන්සේවා අධිකාරිය<br>6. සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම<br>7. සීමාසහිත ශ්‍රීලන්කන් එයාර් ලයින් සහ එහි පාලිත සමාගම් | • සංචාරක පනත (2005 අංක 38)<br>• ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනත (2002 අංක 34)<br>• සිවිල් ගුවන් සේවා පනත (2010 අංක 14)<br>• ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත (1982 අංක 02)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 2. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මතු කරමින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම | | |
| 3. සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු | | |
| 4. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, ප්‍රෞඩ ඓතිහාසික උරුමයන්, පරිසරය, දේශගුණික විවිධත්වය, සයුරු වෙරළ සම්පත් ආදිය මතු කරමින් සුවිශේෂිත සංචාරක දිවයිනක් ලෙස සංචාරකයින් ගේ නිවාඩු නිකේතනයන් හා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ ජාත්‍යන්තරව පිළිගත් හෝටල් පහසුකම්, ගුවන් හා මුහුදු ගමන් පහසුකම් ප්‍රවර්ධනය කිරීම | | |
| 5. ජාත්‍යන්තර හා දේශීය ගුවන් තොටුපලවල් සංවර්ධනය සහ නියාමන කටයුතු සිදුකිරීම | | |
| 6. ගුවන්තොටුපල මගින් සැලසෙන සේවාවන්වල ප්‍රගතිය, ගාස්තු සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම | | |
| 7. ජාත්‍යන්තර ගුවන් ගමන් පුළුල් කිරීම සඳහා අනෙකුත් රටවල් සමග ගිවිසුම්වලට එළඹීම ඇතුලුව අනෙකුත් අවශ්‍ය පියවර ගැනීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(29) සංචාරක සහ ගුවන් සේවා අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 8. ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපලවල් විදේශ රටවල් විසින් භාවිතා කිරීමට අදාළ ප්‍රවර්ධනය හා නියාමනය | | |
| 9. දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම | | |
| 10. පුද්ගලික ගුවන් ගමන් සේවා නියාමනය | | |
| 11. ගුවන්යානා ලියාපදිංචි කිරීම | | |
| 12. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.